# MASTOIDECTOMY

1. **ඔබගේ කණ පැසවීම නිසා කණ අවට ඇති අස්ථිවලට ආසාදනය පැතිර ගොස් ඇත. ශල්‍යකර්මයකින් මෙම නරක්වූ පටක ඉවත් කලයුතුය.**

2. **මේ සඳහා කණ පිටුපසින් කැපුමක් සිදුකරන අතර ඔබගේ කණ අවට හිසකෙස් කැපීමට සිදුවේ.**

3. **ඔබගේ මුහුණේ පේශි ක්‍රියාකරවන ස්නායුව** (Facial nerve) **මොලයෙන් පිටවී කණ තුලින් ගමන් කරන නිසා සැත්කමේදී මෙම ස්නායුවට අනතුරක් සිදුවීමේ අවදානමක් කලාතුරකින් ඇත. මෙම සැත්කම අන්වීක්ෂයකින් බලා ඉතාමත් ප්‍රවේශමෙන් සිදුකරන බැවින් බැවින් ඔබ බිය වියයුතු නැත.**

4. **මැද කණ සහ අභ්‍යන්තර කණ සමීපයේද සැත්කම සිදුකරන බැවින් සැත්කමෙන් පසු කැරකිල්ලක් සහ වමනයක් ඇතිවීමට ඉඩ ඇත. මෙය දින දෙක තුනකින් අවම වීයයි.**

5. **ඔබගේ ශ්‍රවණය, සැත්කමට පසු අවම වී යාමට පුළුවන. සමහරවිට සැත්කමට පසු හොඳින් කණ ඇසීමටද පුළුවන.**
   (***අපගේ මූලික අරමුණ වනුයේ ඔබගේ කණේ ආසාදනය ඉවත්කර මොලයට විෂබීජ ඇතුල්වීමේ අවදානම අවම කිරීමයි***)

6. **සැත්කමට පසු ඔබගේ කණ සැරහුම්** (Crepe Bandage) **වලින් වසා තබනු ලැබේ. දින 2කට පසු මේවා ඉවත් කරනු ඇත.**

7. **ඔබගේ සැත්කමට පසු ප්‍රතිජීවක එන්නත් කරනු ඇත.**

8. **රෝහලෙන් පිටවගිය පසු කණ තුලට දැමීමට බෙහෙත් ලැබෙනු ඇත.**

9. **සතියකට වරක්-මාස 3ක් පමණ සායනයට පැමිණිය යුතුය.**
   (***කණ වියලීයාමට මාස 5ක් පමණ ගතවන නිසා***)